ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
இலங்கைச் சனநாயக சோசலிசக் குடியரசு வர்த்தமானப் பத்திரிகை
The Gazette of the Democratic Socialist Republic of Sri Lanka

අති විශෙෂ அதிவிசேஷமானது EXTRAORDINARY

අංක 1149 / 3 – 2000 සැප්තැම්බර් 12 වැනි අඟහරුවාද – 2000.09.12
1149 / 3 ஆம் இலக்கம் – 2000 ஆம் ஆண்டு செப்தெம்பர் மாதம் 12 ஆம் திகதி செவ்வாய்க்கிழமை
No. 1149 / 3 – TUESDAY, SEPTEMBER 12, 2000

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.) (அரசாங்கத்தின் அதிகாரத்துடன் பிரசுரிக்கப்பட்டது) (Published by Authority)

# I වැනි කොටස : (I) වැනි ඡෙදය — සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

එල්. ඩී. – බී. 4/96.

### 1996 අංක 2 දරන ධීවර හා ජලජ සම්පත් පනත

1996 අංක 2 දරන ධීවර හා ජලජ සම්පත් පනතේ 44 වන වගන්තිය සමග කියවිය යුතු 61 වන වගන්තිය යටතේ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

මහින්ද රාජපක්ෂ,
ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍ය.

2000 සැප්තැම්බර් මස 07 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1. මේ නියෝග 2000 ධීවර කළමනාකරණ (මාතර දිස්ත්‍රික්කයේ තොටමුණ, ගිනිගස්මුල්ල) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. යම් බලපත්‍ර දරන්නකු වෙත නිකුත් කරන ලද බලපත්‍රයෙහි 'මාතර, තොටමුණ, ගිනිගස්මුල්ල ධීවර ප්‍රදේශය සඳහා වලංගු වේ' යන සටහන ඇත්නම් මිස, වෙනත් කිසිම බලපත්‍ර දරන්නකු විසින් මෙහි පළමුවන උපලේඛනයෙහි සඳහන් ප්‍රදේශය ඇතුලත කිසිම ධීවර මෙහෙයුමක නොයෙදිය යුතු ය.

3. බලපත්‍රයේ හෝ වෙනත් යම් නියෝගවල පටහැනිව කුමක් සඳහන් වුවද, කිසිම බලපත්‍ර දරන්නකු විසින් –

(අ) (i) හම්බියාවේ සිට මීටර් 375ක් (සැතපුම් 1/4) එපිට මුහුදේ මිස ඉන් මෙපිට මුහුදේ යම් පාවෙන දැලක් භාවිතා කරමින්: සහ
(ii) මෙහි දෙවන උපලේඛනයේ සඳහන් ධීවර මෙහෙයුම් හැර වෙනත් ධීවර මෙහෙයුම් භාවිතා කරමින්

මෙහි පළමුවන උපලේඛනයේ සඳහන් ප්‍රදේශය ඇතුළත ධීවර මෙහෙයුම්වල නොයෙදිය යුතු ය ;

(ආ) (i) දියඹ වරායේ හැර :
(iii) හම්බියාවට උතුරින් ඇති මුහුදෙහි සිට ගොඩවරායෙහි දකුණු මායිම දක්වා ඇති මුහුදු තීරයේ හැර ; හෝ
(iii) මාදැල් වරායෙහි හැර

මෙහි පළමුවන උපලේඛනයේ සඳහන් ප්‍රදේශයෙහි පොකිරිස්සන් ඇල්ලීමෙහි නොයෙදිය යුතුය.

4. මාදැල් වරාය ප්‍රදේශයේ ධීවර මෙහෙයුම් –

(අ) සෑම වර්ෂයකම ජනවාරි, පෙබරවාරි සහ මාර්තු යන මාසවලදී පමණක් සිදු කළයුතුය ; තවද
(ආ) නයිලෝන් දැල් භාවිත කරමින් සිදු නොකළ යුතු ය.

5. මේ නියෝගවල පටහැනිව කුමක් සඳහන් වුවද මේ නියෝග ක්‍රියාත්මක වන දිනයේ දී වලංගු බලපත්‍රයක සන්තකය දරන යම් බලපත්‍ර දරන්නකුට ඒ බලපත්‍රය බලාත්මක වීම අවසන් වන තුරු ඒ බලපත්‍රය යටතේ ධීවර මෙහෙයුම්වල යෙදීමට හිමිකම තිබිය යුතු ය.

6. මේ නියෝගවල –

"අතුරන දැල්" යන්නෙන් ගැඹුරු ජලයේ ධීවරයින් දෙදෙනකු හෝ ඊට අධික සංඛ්‍යාවක් විසින් එලනු ලබන මීටර් 12.192 සිට 15.240 දක්වා (අඩි 40 සිට 50 දක්වා) වූ අරයකින් යුත් පළල් වූ මුව විවරයක් ඇති යම් කේතු ආකාර දැලක් අදහස් වේ.

"දියඹ වරාය" යන්නෙන්, "ගොඩ වරාය" හෝ "මාදැල් වරාය" හැර මෙහි පළමුවන උපලේඛනයේ සඳහන් ප්‍රදේශය අදහස් වේ.

"ගොඩ වරාය" හෝ "මාදැල් වරාය," යන්නෙන්, නැගෙනහිරින් පරෙයි දූවෙන්ද, උතුරින් මුහුදු වෙරළෙන්ද, බස්නාහිරින් කඩගලින්ද, දකුණින් ගල් තොල්ලෙන්ද, මායිම් වූ මෙහි පළමුවන උපලේඛනයේ සඳහන් ප්‍රදේශය ඇතුළත වූ මුහුදේ කොටස අදහස් වේ.

"කැටය පන්න" යන්නෙන් ගැඹුරු මුහුදේ භාවිත කිත්තම් පටය බිලි කටු එකක් හෝ එයට වැඩි ගණනක් සහ රියම් බරුවක් අමුණා ඇති පිත්තක් අදහස් කෙරේ.

"බලපත්‍රය" යන්නෙන්, 1996 ධීවර මෙහෙයුම් නියෝග යටතේ ධීවර මෙහෙයුම්වල නිරත වීමේ කාර්යය සඳහා නිකුත් කරනු ලැබූ බලපත්‍රයක් අදහස් වේ.

"බලපත්‍ර දරන්නා" යන්නෙන්, 1996 ධීවර මෙහෙයුම් නියෝග යටතේ නිකුත් කරනු ලැබූ වලංගු බලපත්‍රයක සන්තකය දරන තැනැත්තකු අදහස් වේ.

"පොකිරිස්සන් දැල" යන්නෙන්, මුහුදු පත්ලේ එලනු ලබන ඇහිය මිලිමීටර් 76.20 (අඟල් 3) වැඩි වූ යම් දැලක් අදහස් කෙරේ.

"මාදැල්" යන්නෙන්, කෙලවරට පසුම්බියක් අමුණා ඇති කවුදැල් දෙකකින් සමන්විත වූ අවසාන වශයෙන් මසුන් හසුකර ගන්නා වූ මෝර කෙලවර හෙවත් මඩියකින් යුතු වූ මුහුදු වෙරළ දක්වා විහිදෙන්නා වූ කොහු කඹ දෙකක් කවු දැල් දෙකේ අනෙක් කෙළවර ගැටගසා ඇති කායිකව පැදවෙන යාත්‍රා මගින් මසුන් අර්ධ වශයෙන් වටකරමින් වෙරළට ආසන්න මුහුදේ එලනු ලැබ පසුව මිනිසුන් කණ්ඩායම් දෙකක් විසින් ක්‍රම ක්‍රමයෙන් වෙරළට අදිනු ලබන පාරම්පරික අදින දැල් විශේෂයක් අදහස් කෙරේ.

"මරුවැල් පන්න" යන්නෙන් බිලි කොකු සහ ඉපියාවන් අමුණා ඇති ප්‍රධාන යොතකින් සහ ශාඛා යොත්වලින් සමන්විත වූ යාබද ශාඛා යොත් දෙකක් අතර වූ දුර ප්‍රමාණය මීටර් 1.2152 සිට 1.5240 ක් (අඩි 4 සිට 5 දක්වා) වූ දිග යොතක් අදහස් කෙරේ.

"විසිදැල්" හෝ "බරු දැල්" හෝ "අතංගුව" යන්නෙන් තැනැත්තෙකු විසින් නොගැඹුරු දියේ විසි කිරීමෙන් එලනු ලබන මීටර් 4.572 සිට 6.096 දක්වා (අඩි 15 සිට 20 දක්වා) වූ අරයකින් යුතු පළල් වූ මුව විවරයක් ඇති යම් කේතු ආකාර දැලක් අදහස් කෙරේ.

## පළමුවන උපලේඛනය

ශ්‍රී ලංකාවේ නිරිත දිග වෙරළේ, මාතර පරිපාලන දිස්ත්‍රික්කයේ වැල්ලබඩ පත්තුවේ පිහිටා ඇති, නැගෙනහිරින් බ්‍රවුන්ස්හිල් හෙවත් තොඹ්බනින් ද, උතුරින් මුහුදු වෙරළින්ද, බස්නාහිරින් බෙලිගල හා චූලාලංකාර දූපත්වලින් ද, දකුණින් හම්බියාවෙන්ද, මායිම් වූ මාතර තොටමුනේ ධීවර වරාය.

## දෙවන උපලේඛනය

මාදැල්
අතුරන දැල්
කැටයපන්න
මරුවැල්පන්න
විසිදැල් හෝ බරුදැල් හෝ අතංගුව
පොකිරිස්සන් දැල්